රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2024.11.21

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු
වෙබ් අඩවි කර්තෘ

**ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ගරු විපක්ෂනායක තුමාට අයත් අසුනේ හිඳගත් බවට වූ ප්‍රවෘත්තිය සම්බන්ධයෙනි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම් විසින් මා වෙත එවන ලද මේ සමග අමුණා ඇති ලිපිය හා බැදේ.

දසවන පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය අද (21) ආරම්භ කිරීමේ දී යාපනය දිස්ත්‍රික් ස්වාධීන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ගරු විපක්ෂනායක තුමාට අයත් ආසනයේ හිඳගත් බවට වන ප්‍රවෘත්තිය, එම ගරු මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු බව පවසමින් හිරු මාධ්‍ය ජාලයට අයත් ෆේස්බුක් පිටුවක් ඔස්සේ ප්‍රචාරය විය.

මේ වන විට එම සාවද්‍ය පුවත අදාළ ෆේස් බුක් පිටුවේ නිවැරදි කර ඇතත් ඒ ආශ්‍රයෙන් සකස් කරන ලද අසත්‍ය පුවත් තව දුරටත් විවිධ මාධ්‍ය ඔස්සේ සංසරණය වේ. එබැවින් එබඳු සාවද්‍ය වාර්තාකරණයන් නිවැරදි කරන ලෙසත් වගකිව යුතු හා නිදහස් මාධ්‍ය සම්ප්‍රදායක් වෙනුවෙන් එක්වන ලෙසත් සියළු මාධ්‍ය ආයතන වලින් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහය කෘතඥතා පූර්වකව අගය කරමි.

**එච්.එස්.කේ.ජේ. බණ්ඩාර**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

**දුරකථන අංකය :- 0112-513638**
**ෆැක්ස් :- 0112 -514753**
**විද්‍යුත් ලිපිනය :- dgi@dgi.gov.lk**

ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
அரசாங்கக் கட்சி முதற்கோலாசான் அலுவலகம் - இலங்கைப் பாராளுமன்றம்
OFFICE OF THE CHIEF GOVERNMENT WHIP - PARLIAMENT OF SRI LANKA

පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ / பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை / Parliament, Sri Jayewardenepura Kotte

මගේ අංකය / எனது இல / My No

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2024.11.21

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**මාධ්‍ය නිවේදනය**

අද දින පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ ගරු විපක්ෂනායකතුමාගේ පුටුවෙහි වාඩි වූ "මාලිමාවේ මන්ත්‍රීතුමා" යනුවෙන් හිරු ආයතනය විසින් හා සමාජ මාධ්‍ය ජාලාවල ප්‍රචාරණය වූ ප්‍රවෘත්තිය සම්බන්ධයෙනි.

ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ ආසනයේ වාඩිවූ මන්ත්‍රීවරයා ජාතික ජන බලවේගය කණ්ඩායමේ මන්ත්‍රීවරු 159 දෙනාගෙන් කිසිවකු නොවන බව දන්වා සිටිමි. හිරු ආයතනය විසින් ආණ්ඩුවේ මන්ත්‍රී කණ්ඩායම සම්බන්ධ කර ගෙන ප්‍රචාරය කළ මෙම ප්‍රවෘත්තිය කිසිදු පදනමක් නැති අසත්‍ය ප්‍රවෘත්තියකි. එම සිදුවීම සම්බන්ධ මන්ත්‍රීවරයා යාපනයේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ස්වාධීන 17 කණ්ඩායමෙන් තේරී පත්වූ විපක්ෂ මන්ත්‍රීවරයෙක් වන "ගරු රාමනාදන් අර්චුනා" මන්ත්‍රීවරයා බව දැනුම් දී සිටිමි.

එම නිසා මාලිමාව සම්බන්ධ කර ගෙන හිරු ආයතනය ප්‍රචාරය කළ මෙම ප්‍රවෘත්තිය අසත්‍ය හා පදනම් විරහිත බව සියළු මාධ්‍ය වෙත දන්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ජේ.එම්.ජේ.කේ. ජයසුන්දර
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්

Government Secretary : + 94 (0)11 2777453, + 94 (0)11 2777100 - Ext. 6201 / 6210 ... Fax : + 94 (0)11 2777456
E-mail : ...@parliament.lk